# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,456 - 2006 ජූලි 28 වැනි සිකුරාදා - 2006.07.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 616 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 598 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 616 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 617 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 622 |
| නාවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

*සැ. යු.* (i) සමස්ත ලංකා කිරිගොවි සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 ජුනි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සමස්ත ලංකා ගොවිජන සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 ජුනි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 අගෝස්තු මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූලි මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 181

අංකය : ඩී/ඒඑෆ්/316.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවා කාලය දීර්ඝ කිරීමක්

ඉහත නම සඳහන් නිලධාරියාගේ ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයේ සේවා කාලය 2006 මාර්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසර දෙකකින් දීර්ඝ කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් දොන් ප්‍රදීප් සුජීව කන්නන්ගර (01559) - පාලන/ රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී,
පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය
පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

07-451

2006 අංක 182

අංකය : ඩී/ඒඑෆ්/228.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක්

2005 අප්‍රේල් මස 07 වන දින සිට පහත නම් සඳහන් කැඩෙට් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් වශයෙන් පත් කිරීමටත් එදිනම සිට ඔහුගේ නමට ඉදිරියෙන් ඇති ශාඛාවට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කොට ඇත.

11100 කැඩෙට් නිලධාරි – ඇත්තිලිගොඩ ගමගේ සමීර සුපුෂ්පිත ගමගේ – (02580) – දන්ත

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂ/මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.

07-450

# වෙනත් පත්කිරීම් ආදිය

2006 අංක 183

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45(3) වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය අමරසිරි දොඩංගොඩ වන මම පහත උපලේඛනයේ සඳහන් නීතිඥ මහත්ම/මහත්මීන් අදාල අධිකරණ කොට්ඨාස සඳහා සාමදාන විනිශ්චයකාරවරුන් සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත් කරමි.

අමරසිරි දොඩංගොඩ,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2006 ජූලි මස 11 වැනි දින,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

උපලේඛනය

| | *නම* | *ලිපිනය* | *අධිකරණ බල ප්‍රදේශය* |
|---|---|---|---|
| 01. | නීතිඥ සම්පත් සේනක බණ්ඩාර ඇපාකන්ද මහතා | අංක 202, අහුණුවෙල, පේරාදෙණිය | මහනුවර |
| 02. | නීතිඥ ඩී. කරුණාරත්න මහතා | අංක 154, ප්‍රීති මාවත, මහවැලි උයන, මහනුවර | මහනුවර |
| 03. | නීතිඥ ඉඹුලේ ගමරාලලාගේ අබේසිංහ මයා | අංක 7/3, හොරණ පාර, මත්තෙගොඩ හන්දිය පන්නිපිටිය | අවිස්සාවේල්ල |
| 04. | නීතිඥ හඳුන්නෙත්තිගේ සීතා හඳුන්නෙත්ති මිය | අංක 770/9, හයිලෙවල් පාර, පනාගොඩ, හෝමාගම | අවිස්සාවේල්ල |
| 05. | නීතිඥ ඩබ්. ආර්. ලක්ෂ්මන් ගුණසිරි විජේසුන්දර මහතා | අංක 293, පමුණුව පාර, මහරගම | අවිස්සාවේල්ල |

| | නම | ලිපිනය | අධිකරණ බල ප්‍රදේශය |
|---|---|---|---|
| 06. | නීතිඥ ප්‍රියංකා මද්දුමපටබැඳි මිය | අංක 3/10ඒ, මාවතගම, හෝමාගම | අවිස්සාවේල්ල |
| 07. | නීතිඥ ජේ. කේ. දොන් පද්මසිරි මහතා | අංක 230/1, ප්‍රගති මාවත, හෝමාගම | අවිස්සාවේල්ල |
| 08. | නීතිඥ බන්දුසේන ලියනගේ මහතා | අංක 263/7ඒ, හයිලෙවල් පාර, කොට්ටාව | අවිස්සාවේල්ල |
| 09. | නීතිඥ නාලිකා කුමුදුනී කලුපහන මිය | අංක 351, අංගම්පිටිය, | අවිස්සාවේල්ල |
| 10. | නීතිඥ ඩබ්. මාලිකා නිලංගී ධනුසේකර මිය | 'තිලකසිරි', සුදුවැල්ල පාර, වෑකඩ, පානදුර | පානදුර |
| 11. | නීතිඥ කමනී ශ්‍යාමලී යාපා මිය | අංක 20/1, සෙනෙවිරත්න පෙදෙස, කලුතර දකුණ | කලුතර |
| 12. | නීතිඥ සිවාරානිරත්නම් ගංගාධරන් මිය | අංක 47, සාන්ච්ආරච්චි වත්ත, කොළඹ 12 | කොළඹ |
| 13. | නීතිඥ චන්ද්‍රිකා අරුන්දතී සුමේධා ජයවීර බණ්ඩාර මිය | අංක 162, හිල් වීදිය, දෙහිවල | ගල්කිස්ස |
| 14. | නීතිඥ ජෝයි මහිල් මහාදේවන් මිය | අංක 79, කන්දසාමි කෝවිල පාර, වවුනියාව | වවුනියාව |
| 15. | නීතිඥ එම්. එම්. විජිත පීරිස් මහතා | අංක 169/1ඒ, කැප්පෙටිපොල මාවත, බදුල්ල | බදුල්ල |
| 16. | නීතිඥ ඒකනායක මුදියන්සේලාගේ තිශේන්ද්‍ර ඒකනායක මහතා | අංක 17බී, පන්සල පාර, මීගමුව | මීගමුව |
| 17. | නීතිඥ බී. ජේ. එදිරිසිංහ මිය | 'වීරවිලා', බද්දේගම පාර, ගෝනපීනුවල | බද්දේගම |
| 18. | නීතිඥ දොන් කිත්සිරි කාරියප්පෙරුම මහතා | අංක 270/12 එච්, රෝයල් උද්‍යානය, හොරණ | හොරණ |
| 19. | නීතිඥ බී. සුමිත් අමරසිරි මහතා | අංක 16/2, දුම්රියපොල පාර, විහාරගොඩ, බදුල්ල | බදුල්ල |
| 20. | නීතිඥ සරත් රුබසින් ජයවර්ධන මහතා | අංක 12බී, රොක්හිල්, පහනළහ, පුවක්පිටිය | අවිස්සාවේල්ල |
| 21. | නීතිඥ ආර්. ඩබ්ලිව්. එම්. ගීතා ශ්‍රියානි රණතුංග මිය | අංක 33/5, කුරුප්පු පාර, කොළඹ 08 | කොළඹ |
| 22. | නීතිඥ කලුදේව ජානකි අසෝකා ද සිල්වා මෙනවිය | අංක 125, මාදුව පාර, බලපිටිය | බලපිටිය |

07-457

# ආණ්ඩුවේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වෙනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත් වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥා පනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1), 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඩබ්ලිව්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව.

2006 ජූලි මස 04 වැනි දින,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (1) 40233 | සම්පතාවඩුගේ චන්ද්‍රානී සිල්වා මිය අංක 25/1 ඩී, මැදවේල්ල පාර, තල්පුරුව, පානදුර | කැකුලහන්දිගේ ධනවතී සිල්වා මිය, අංක 14, ගලගෙදරවත්ත, මොරවින්න, පානදුර |
| (2) 40234 | කටුවාවලගේ දෝන විමලාවතී අංක 193, ඔබහේන පාර, මාදිවෙල, කෝට්ටේ | මුදලිගේ දෝන චමිලා ගයානි අමරසිංහ මිය, අංක 80/1, කස්සප පාර, කොළඹ 05 |
| (3) 40237 | 1. ලක්ෂ්මී සුමිත්‍රා ඇල්ලේවෙල මිය, 2. විදාන ආරච්චිගේ වයලට් පෙරේරා මිය, අංක 25, ගාලේවත්ත, කටුගස්තොට | මහමුනිගේ නිමල් මයා අංක 81, උයන්වත්ත, නුගවෙල |
| (4) 40256 | මල්වත්ත විදානෙලාගේ සුජාතා චාන්දනී සමරසිංහ (මිය ගොස්) 1. දේවගිරි හේනයලාගේ වසන්ත ශ්‍රී ලාල් විමලවීර, 2. දේවගිරි හේනයලාගේ කුමුදුමාලි හංසිකා විමලවීර 3. දේවගිරි හේනයලාගේ නිලන්ත ඉඳුනිල් විමලවීර, (බාලවයස් කරුවන්) මහගෙදර වත්ත, ගම්මන, පොතුහැර. | අකුරන්ගේ ජයසේන මයා, 'පූර්ණමලා', කොරවතුරගම, කොහිලෙගෙදර |
| (5) 40263 | මොහොමඩ් ඉස්මායිල් සේහු අලාවේදින් මයා, අංක 17/1, කුරිකොටුව, පහමුණේ, නාරම්මල | ගෝනගලගේ චමින්දනී ගුණවර්ධන මිය, දෙහෙල්ගමුව, යටිගල්ඔලුව |
| (6) 40275 | දොලපිහිල්ලේ කුඹුරේ ගෙදර අනෝමා වීරසිංහ මිය අංක 50, දොලපිහිල්ල, පූජාපිටිය | කොහොලානේ ගෙදර විජේරත්න මයා, අංක 18, හරංකහව, අඹරුප්ප. |

07-437

---

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ නිවේදනය

110 වෙනි අධිකාරිය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම වන මම 1935 සැප්තැම්බර් මස 20 වෙනි දින අංක 8146 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනය එහි මාධ්‍යම පළාත, මාතලේ දිස්ත්‍රික්කය යන ශීර්ෂය යටතේ ;

*උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත* :

මාතලේ මැදසිය පත්තුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 05 දරන විෂයය වෙනුවට මෙහි වූ "අ" උපලේඛනයෙහි හා " ආ " උපලේඛනයෙහි සඳහන් විෂයන් ආදේශ කිරීමෙන්.

මාතලේ උඩසිය පත්තුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාල වන අංක 04 දරන විෂයය වෙනුවට මෙහි වූ "ඇ" උපලේඛනයෙහි සඳහන් විෂය ද

රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත :

" ඈ " උපලේඛනයෙහි සඳහන් විෂයය ද ආදේශ කිරීමෙන්.

2006 ජුනි මස 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍ය.

2006 ජුනි මස 19 වෙනි දින,
කොළඹ දී ය.

මාතලේ දිස්ත්‍රික්කය

*උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

*"අ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත මාතලේ මැදසිය පත්තුව නැගෙනහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය

| | |
|---|---|
| අලුපොතුවල | මාරුකොනගම |
| අලුපොතුවල ඇලටන් වත්ත | මාරුකොනවත්ත ජනපදය |
| බඩල්ගම්මැද්ද | මැද්දේගොඩ |
| බ්‍රෙන්ඩියුලා වත්ත | නියරේපොල |
| මධ්‍යම නිවාස | නුර්ජාන්වත්ත |
| දිබ්බුරුවෙල | පල්ලියවත්ත |
| දිගනහේන | පරගහවෙලගම |
| දිඹුල්ගොඩ | පුංචිගම |
| දුඹුකොළ | රයිතලාවෙල |
| ගල්ඔය | රත්වත්ත |
| ගනේගොඩ | රත්වත්ත නව ජනපදය |
| ග්‍රෝව් වත්ත | තිබ්බටුමුල්ල |
| ගුරුකැටගම | උඩත්තාවල |
| හෙට්ටියාවත්ත | උහදරුඩ |
| කඩුවෙල | උල්පතගම |
| කඩුවෙල වත්ත | උල්පතපිටිය |
| කහටගහවත්ත | උණගොල්ල ජනපදය |
| කටුදෙණිය | වළකුඹුර |
| කිතුල්ගහකොටුවගම | වාරියපොල ඒ ජනපදය |
| කුරීවෙල ජනපදය | වාරියපොල වත්ත |
| කුරීවෙලගම | වාරියපොල නව ජන පදය |
| කුරීවෙලවත්ත | වාරියපොලගම |
| කුරුගොඩවත්ත | වයාම්ටා ජනපදය |
| මාබේරියගම | වීරපුරන්අප්පු පෙදෙස |
| මැල්වරින්වත්ත | වැලිගලගම |
| මානාබොඩගම | වැව්ගම්මැද්ද |
| මාරුකොන බී ජනපදය | |

*"ආ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත මාතලේ මැදසිය පත්තුව බටහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය.

| | |
|---|---|
| අලිගාර්වත්තගම | මාරුකොනවත්ත |
| ඇල්වලගම | මීදෙණිය ජනපදය |
| බලකඩුව | නාගොල්ලගම |
| බලකඩුව වත්ත ජනපදය | නුගපිටිය |
| බොරළුව කොටස | පන්සල්තැන්නවත්ත කොටසක් |
| බෝවත්තගම | පිහිල්ලදෙණියගම |
| සී ජනපදය | පිහිල්ලකන්දවත්ත |
| දෙමටගොල්ලගම | පෝසිලේන් පෙදෙස |
| ගංගොඩගම | පෙරොස්හිල්වත්ත |
| ගුරලවෙල උතුර | තවලංකොයගම |
| ගුරලවෙල දකුණ | උඩුපිටිය |
| හිද්‍රා ජනපදය | උකුවෙලවත්ත |
| කැකුලන්පිටියගම | උකුවෙලගම |
| කලල්පිටිය නව ජනපදය | එක්සත් ජනපදය |
| කලල්පිටිය පැරණි ජනපදය | උයන්වත්තගම |
| කලල්පිටියවත්තගම | වරකාමුරගම |
| කළුව මුදුනගම | වාරියපොළවත්ත (කොටසක්) |
| කලල්පිටියගම | වැලිකන්දවත්ත ජනපදය |

| | |
|---|---|
| කන්දේමඩ ජනපදය | වැලිකන්දගම |
| කොහොඹිලිවෙල ජනපදය | යොන්පිටිය |
| කොහොඹිලිවෙලගම | |

*"ඇ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත මාතලේ උඩසිය පත්තුව දකුණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය :

| | |
|---|---|
| ආනන්ද ජනපදය | මහතැන්නගම |
| අතිරහපිටිය | මැරින්වත්ත |
| බ්‍රෙන්ඩියුලාවත්ත කොටසක් | නවරත්නගොඩ කොටසක් |
| කැම්බල් රක්ෂිත වනය | පහළ වැහිගල |
| දෙහිදෙණිය | පල්ලේතැන්න |
| මැතිවරණ නිවාස | පනන්තඩිය |
| ඇල්කඩුව | පිංහේන |
| ඇල්කඩුව රාජ්‍ය වතුයාය | රන්බිම ජනපදය |
| හෙයාවුඩ් ජනපදය | රංගම |
| හෙයාවුඩ්වත්ත | රත්වත්ත බී ජනපදය |
| හුන්නස්ගිරිය ජනපදය | රත්වත්ත ඉහළ කොටස |
| හුන්නස්ගිරියවත්ත කොටසක් | රත්වත්ත පහළ කොටස |
| හුණුකැටවල | රුසිරුගම |
| ඉඹුල්පිටිය කොටසක් | සේරුගොල්ල ජනපදය කොටසක් |
| ඊරියගොල්ල | ස්ත්‍රැතිස්ලාවත්ත ඒ ජනපදය |
| කඩුවෙලවත්ත ජනපදය | උඩ වැහිගල |
| තාලිංගාමඩ ජනපදය | උඩංගමුව |
| කරගහහින්න | උඩතැන්න |
| කැන්දගොල්ලමඩ | වේගලවත්ත |
| ලැලිඅඹේ | වැහැර ගම්මැද්ද |
| මැදගම | වැලිගලගම |
| මහතැන්න වත්ත ජනපදය | |

*රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

*"ඈ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත මාතලේ උඩසිය පත්තුව උතුර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ

| | |
|---|---|
| නිවාස 20 ජනපදය | කොස්වාන ගම |
| අල්වත්ත | කුඹුරේ ගම්මැද්ද |
| අම්බලවත්ත | මහසෙළුවාකන්දවත්ත |
| බණ්ඩාරපොලවත්ත | මහසෙළුවාකන්දවත්ත ජනපදය |
| බණ්ඩාරපොල එෆ් ජනපදය | මහතැන්න ජනපදය |
| බණ්ඩාරපොල- මුවන්දෙණිය | මහතැන්න වත්ත |
| දෙහිඅත්තාමඩ | මුත්තේට්ටුතැන්න |
| දෙනියකුඹුර | මුවන්දෙණිය |
| දොඹගොඩ | මුවන්දෙණිය වත්ත |
| දොඹගොඩ ජනපදය | මුවන්දෙණියමලේ |
| දුනුකේවත්ත | නක්කාලිමලේ |
| එපිටමුල්ල ජනපදය | නානුමුරේ |
| එපිටමුල්ල වත්ත | නෙළුවාකන්ද |
| එපිටමුල්ල ගම | නව ජනපදය |
| ගලමලේ | පහළ හපුවිද |
| ගල්ගේවත්ත | පල්ලේයාය ජනපදය |
| ගන්සරපොල | පඹගොල්ල |
| ගොඩපොල | පිටකන්ද වත්ත |
| ගොඩපොලවත්ත | පොල්වත්ත ජනපදය |
| ගොඩපුස්ස | පුංචිසෙළුවාකන්ද වත්ත |
| හල්ගොල්ල ජනපදය | රත්වත්ත අක්කර 10 ජනපදය |

හල්ගොල්ල ගම
හහරන්කන්ද ජනපදය
හහරන්කන්ද වත්ත
හවරිය වත්ත ජනපදය
හැමුරේ
හුණුගල වත්ත
කාච්චමලේ වත්ත
කන්දේනුවර අක්කර 18 වත්ත
කන්දේනුවර ඒ ජනපදය
කන්දේනුවර බී ජනපදය
කන්දේනුවර වත්ත
කන්දේනුවර අංක 2 ජනපදය
කරගහලන්ද
කෙහෙල්වත්ත
කැන්දගොල්ල
කිවුල
කිවුල ජනපදය
කොස්වාන ජනපදය
රත්වත්ත වත්ත
සපුමල්ගම
සේරුගොල්ල
සේරුගොල්ල ජනපදය
ස්තුතිස්ලා ජනපදය
ස්තුතිස්ලා වත්ත
සුදුගහවත්ත
තඹලගල
උඩහපුවිද
උඩුමුල්ල
උල්පතපිටිය
විහාරගමවත්ත
වරාපිටිය
වටගොඩවත්ත
වැදියක්පිටිය
වැදියාපිටියවත්ත
වැටස්යාය

07-452

---

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ නිවේදනය

110 වෙනි අධිකාරය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම වන මම 1935 සැප්තැම්බර් මස 20 වෙනි දින අංක 8146 දරන *ගැසට්* පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනය එහි බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කය යන ශීර්ෂය යටතේ ;

*කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත* :

මුල්ලේරියාව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාශයට අදාළ වන අංක 20 හා අංගොඩ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 13 යන විෂයයන් එකාබද්ධ කර මෙහි වූ "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන්,

2006 ජුනි මස 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2006 ජුනි මස 13 වෙනි දින,
කොළඹ දී ය.

### කොළඹ දිස්ත්‍රික්කය

*කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

*"අ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත මුල්ලේරියාව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය.

අභිනවාරාම පාර
අඹතලේ පාර
අංගොඩ වත්ත
අවිස්සාවේල්ල පාරෙන් (කොටසක්)
බාරොන් තිලකානන්ද මාවත
බටකැටිය පාර
බැලගම පාර
දෙල්ගහවත්ත පාර
ගල්වලහේන පාර
ගොඩඋඩවත්ත
ගොඩැල්ල මාවත
හල්බරාව පාර
හිඹුටාන පාර
රෝහල පාර
රෝහල වටා පාර
ජයන්ති මාවත
කබරගලවත්ත
කුමාර මාවත
වැව පාර
මහවත්ත පාර
මල්ගම පාර
මාලිගාගොඩැල්ල පාර
මණ්ඩාවිල පාර
මැණික් ආගර වත්ත පාර
මුල්ලේරියාව රෝහල පාර
එන්. ටී. පෙරේරා මාවත
පංචවත්ත
පැරකුම්බා මාවත
පෙතියාගොඩ පාර
පොල්වත්ත
ප්‍රගති මාවත
රාහුල පාර
රාජසිංහ මාවත
ගහ අසබඩ පාර
ශාන්ති මාවත
සිරි පැරකුම්බා මාවත
තලාහේන බෝධිය පාර
තලාහේන පාර
උඩුමුල්ල
වැකන්ද පාර

07-453

---

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ නිවේදනය

110 වෙනි අධිකාරය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම වන මම 1935 සැප්තැම්බර් මස 20 වෙනි දින අංක 8146 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනය එහි උතුරු මැද පළාත, අනුරාධපුර දිස්ත්‍රික්කය යන ශීර්ෂය යටතේ ;

*ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත* :

1. කලංකුට්ටිය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාශයට අදාළ වන අංක 29 දරන විෂයය වෙනුවට මෙහි වූ "ඇ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ද,

*රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත* :

1. රාජාංගනය – තඹුත්තේගම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාශයට අදාළ වන අංක 04 දරන විෂයය වෙනුවට මෙහි වූ "ඉ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ද,

*තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත* :

1. තලාව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාශයට අදාළ වන අංක 03 දරන විෂයය වෙනුවට මෙහි වූ "ඊ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ද,

*තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත* :

1. කලංකුට්ටිය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 29 දරන විෂයට ඉක්බිතිව මෙහි වූ "අ" දරන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් ද.

2. රාජාංගනය – තඹුත්තේගම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාශයට අදාළ වන අංක 04 දරන විෂයයට ඉක්බිතිව මෙහි වූ " ආ " දරන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් ද,

3. තලාව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 03 දරන විෂයයට ඉක්බිතිව මෙහි වූ "ඇ" දරන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන්

2006 ජූනි මස 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2006 ජූනි මස 13 වෙනි දින,
කොළඹ දී ය.

### අනුරාධපුර දිස්ත්‍රික්කය

### *තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

*"අ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත මුදුන්ගොඩ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය.

අම්බලංගල
දෙහෙල්ගමුව
හැළඹවැව
හුරීගස්වැව
මකුලැව
මුදුන්ගොඩ
නව මකුලැව
නව තලාකොළවැව
පළුගස්වැව
සම්පත්ගම
සියඹලාගස්වැව
සුදර්ශනගම
තලාකොලවැව
තම්මැන්නාව
වැලියාව

*" ආ " උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත තඹුත්තේගම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය.

2 වෙනි පියවර
බැඳිවැව
දඹුලුපුර
දෙමටවැව
ගල්විහාර වැව
ගැමුණුපුර
ඉකිරිවැව
ඉපිල්වත්ත
ජනජයගම
ජයලඳගම
ජයසිරිගම
කිත්සිරිගම
කෝන්වැව
මලියදේවපුර
මුසල්පිටිය
නල්ලච්චිය
නවගත්තේගම
රාජපක්ෂගම
රත්වත්තලාගම
සමගිපුර
සමන්එළිය
තඹුත්තේගම
තම්මැන්නාගම
තේක්කවත්ත
තෙල්හිරියාව
තිස්පනේ පුර
කොත්මල්පුර
කුඩාබිලිබැව
කුඩාගම
ලුණුවැව

| | |
|---|---|
| | ගම්මාන 03 (නුගගහවැව) |
| | ගම්මාන 04 |
| | ගම්මාන 07 |

*"ඇ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත පහළගම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය

408 මැහි ඇල්ලාව
අකුරණයාගම
බණ්ඩාරගම
දෙල්නේගම
ඊරියාගම
ගුරුගම
හංගිලිගම
කලවැල්ලාව
කැලේගම
කෝන්ගොල්ලෑව
කුඩාබෙල්ලන්කඩවල
කුඩාවැව
මහබෙල්ලන්කඩවල
මල්වානේගම
මුදුනේගම
නවගහසිරිපුර
ඔරුගලයාය
පහළගම
පයින්ඩිකුලම
පොතියාගම
රංගිලිගම
සෝලම
තලාකොළවැව
තම්මැන්නාව

### *ගලේනැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

*"ඇ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත කලංකුට්ටිය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය.

ගල්කෙම
ඉහළ කලංකුට්ටිය
කුරකැප්පෙටියාව
කුරටියාව
මාවත්තේගම
නාමල්ගමුව
ඕබඩයාගම
ඔටුණුපැළඳිගම
පහළ කලංකුට්ටිය
පත්තිනිගම
තම්මැන්නාගම

*රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*

*"ඉ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත රාජාංගනය උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය

4 කණුව
5 කණුව
ධීවර ගම්මානය
හොරොම්බාගම
අන්තර් කලාපය
කදුරුගස්වැව උස්සාන
නව ගම්මානය
සමගි පෙදෙස
සිරිමාපුර
යාය 01
යාය 02 උස්සාන කොටස
යාය 03 රාජාංගනය
යාය 04 රාජාංගනය
යාය 05
යාය 05 උස්සාන කොටස
යාය 06 අක්කර 50
යාය 06 ධීවර ගම්මානය
ගම්මාන අංක 02
ගම්මාන අංක 03

*තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

*"ඊ" උපලේඛනය*

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත තලාව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය.

| | |
|---|---|
| 2 ගම්මානය | කැටකාලේ |
| 3-4 ගම්මානය | කිරලෝගම |
| 410 කුමාරඑළිය | කොහොඹකඩවල |
| 411, 2-4 ගම්මානය | කොරගහවැව |
| 419/1, ජයශ්‍රීපුර | කෝරළයාගම |
| 419/2 ශ්‍රී දළදාපුර | කොටවැව |
| 419/3 තිස්සනේපුර | කුඹුක්ගහවැව |
| 420 කරගහවැව | කුරුඳුවැව |
| ආචාරිගම | මීගස්සැගම |
| බිඳුංකඩ | මිහිරිගම |
| දංගහකඩවල | මොරගොඩ |
| ගල්නෑව | නබඩවැව |
| ගම්බිරිගස්වැව | නව හගුරන්කෙත |
| හිඟුරවැව | පහළ තලාව |
| ගිරිගොල්ලේගම | පැරණිගම |
| ඉඳිගස්පොතාන | රත්තොටගම්මානය |
| ඉහළ මොරගොඩ | සුමුදුගම |
| ඉහළ තලාව | තලාව කඩවීදිය |
| ඉහළ වැව | තිරප්පනේ |
| ඉලන්දක්කුලම | වරාගොඩ |
| කැලේකුඹුක්වැව | |

07-454

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

(පීවීඑස්) 5537.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ සීමාසහිත කැෂුවර්රිනා බීච් හොටෙල්ස් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ 145 අධිකාරය විධිවිධාන යටතේ 1979 පෙබරවාරි 16 දින සංස්ථාපිත සමාගමක් වන කැෂුවර්රිනා බීච් හොටෙල්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, කැෂුවර්රිනා බීච් හොටෙල්ස් ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ජුනි මස 27 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

07–500

එන් (පීවීඑස්) 4847.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ලෙදර්ටෙක්ස් ලිමිටඩ් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ 145 අධිකාරය විධිවිධාන යටතේ 1977 නොවැම්බර් 04 දින සංස්ථාපිත සමාගමක් වන ලෙදර්ටෙක්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ලෙදර්ටෙක්ස් ලිමිටඩ්හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ජුනි මස 27 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

07–501

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - තිට්ටඹුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006 ජූනි 29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2003 නොවැම්බර් මස 11 දින හා අංක 4061 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම වත්තේගෙදර විජේසූරිය සහ වත්තේගෙදර උපුල් සම්පත් කුමාර විජේසූරිය යන අය ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හැටහත්දහස් හත්සිය හත්තෑහත (රු.467,777)ක මුදලක් 2005 දෙසැම්බර් 31 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු.467,777 ක මුදලට 2006 ජනවාරි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4061 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂන්ල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභාවේ, මීරිගම උපකාර්යාල සීමාව තුළ, තවලම්පිටියේ පිහිටි බෝගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ජේ. පී. එන්. ජයසුන්දර විසින් 2003 ක් වූ ඔක්තෝම්බර් මස 08 වන දින සාදන ලද අංක 2584/ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන ඉඩම් කොටසට උතුරට : ප්‍රේමලතාට අයිති 1ආර් 1 දරන ඉඩම ද, නැගෙනහිරට : බී. ඒ. ආරියවන්දට අයිති ඉඩම ද, දකුණට : අංක 2584 දරන පිඹුරේ ලොට් ඒ 2 න් ද සහ බටහිරට : ලොට් බී වලින් ද මායිම් වූ පර්චස් නවයයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.75) ක් විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් සියළු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-518/1

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-බොරලැස්ගමුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006 මැයි 25 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2002 මාර්තු මස 13 සහ 2003 සැප්තැම්බර් 09 දින සහ පිළිවෙලින් අංක 216 සහ 582 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මලින් වානක දුල්ලෑව ණයකරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ හැටඑක්දහස් නමසිය අනූවයි ශත අසූදෙක (රු. 661,990.92) ක මුදලක් 2006 පෙබරවාරි මස 28 වන දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 661,1990.92 ක මුදලට 2006 මාර්තු මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 216 සහ 582 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර, ගහ පලාත, මොළදණ්ඩේ, පිහිටි එල්හාගොඩ *හෙවත්* "එළුහාගොඩහේන" තොටපොලදෙනිය, හිරිනලගොල්ල සහ කුරුම්බේහේන නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එන්. බී. ඩී. වැත්තෑවේ විසින් 1988 ජූලි මස 05 වන දින අංක 790 සහ බලයලත් මානක එන්. බී. ඩී. වැත්තෑවේ විසින් සාදන ලද 1998 ජූලි 05 දිනැති අංක 790 දරන පිඹුරට ඔහු විසින්ම 2001 සැප්තැම්බර් මස 13 දින නැවත පිටසන් කරන ලද පිඹුරේ ලොට් 2 බී ලෙස සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම ලොට් අංක 2 බී දරන ඉඩම් කොටසට උතුරට සහ ඊසානදිගට : ලොට් 1න් ද, නැගෙනහිරට : පොදු පාරෙන් ද දකුණට : ලොට් 2ඒ ද, බටහිරට : තොටපොලදෙණිය කුඹුර සහ ලොට් 1 න් ද මායිම් වූ එකී අංක 790 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිපහ (අ. 0, රූ. 0, පර්. 25) ක් විශාලත්වය ඇති ඉඩම මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 411/139 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක එන්. බී. ඩී. වැත්තෑවේ විසින් 1988 ජූලි මස 05 වන දින මැන සාදන ලද අංක 790 දරන පිඹුරේ සඳහන් මාර්ග අයිතිය ද සමග වේ. (පාරක් සඳහා වෙන් කරන ලද කොටස)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-518/2

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මාරවිල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006 ජූනි 29 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ඊ. කරුණාරත්න විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 1997ජූලි 22 දින හා අංක 11495 දරන බැඳුම්කරය සහ 11496 දරන ලිඛිතය යටතේ අයවිය යුතු මුදල ගෙවීම "චූටි කුමාරි" යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන වර්ණකුලසූරිය කැනී ලීටස් ලොව් යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ විසිදහස් අටසිය හතලිස්හතයි ශත හැටදෙක (රු.520,847.62) ක මුදලක් 2005 දෙසැම්බර් මස 29 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 520,847.62 ක මුදලට 2005.12.30 වන දින සිට විකිණීමේ දින දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 11495 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහනාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරළේ කම්මල් පත්තුවේ කොලින්ජාදියේ පිහිටි මහහේතුගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක වයි. එම්. රංජිත් යාපා විසින් 1991 ක් වූ ජූනි මස 22 වන දින මැන සාදන ලද අංක 3768 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 4 ඒ දරන ඉඩම් කොටසට මායිම් වන (අවසරලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද පිඹුරේ ලොට් 4 දරන කොටසේ උප බෙදුමක් වන) උතුරට : ඩබ්. බී. තිසේරාට අයිත ඉඩම ද, නැගෙනහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 4/බී ද, දකුණට : අධිවේගී මාර්ගය දක්වා දිවෙන හරස් පාරේන් ද, බස්නාහිරට : ඉහල පිඹුරේ ලොට් 2 සහ 3 න් ද මායිම් වූ රූඩ් එකයි (අ. 0, රූ. 1, පර්.0) ක් විශාලත්වය ඇති ඉඩම ඊට අයත් සියළු දේත් සමග මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 22/257 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-518/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.